# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2282/55 – 2022 ජුනි 02 වැනි බ්‍රහස්පතින්දා – 2022.06.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන පරවශතා, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශතාව අත්කර ගනු ලබන්නේ කවර ඉඩමකින් ද යන්න 2 ඡේදයේ විස්තර වේ. (2013.07.26 දිනැති 5 ප්‍රකාශය මෙයින් අවලංගු කරමි.)

1. **පරවශතාවේ විස්තරය.**– නිවාස ක්‍රමයට ප්‍රවේශ මාර්ගය සඳහා පරවශතා අයිතිය අත්කර ගැනීම.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ, පොල්හේන ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම්/කැල/99/252 හා 2000.01.25 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩමට මායිම්:

01. **කැබලි අංක 1 – ඕබන්වත්ත නොහොත් පොල්හේනවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0266ක් පමණ**

උතුරට: සෝමවතී පෙරේරා හිමිකම් කියන පොල්හේන දෙවන පටුමග වරි. අංක 23 දරන ඉඩම, දයාවතී විජේතිලක හිමිකම් කියන පොල්හේන දෙවන පටුමග වරි. අංක 29 දරන ඉඩම හා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ඉඩම; නැගෙනහිරට: ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ඉඩම; දකුණට: ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ඉඩම හා පාර; බටහිරට: පාර සහ සෝමවතී පෙරේරා හිමිකම් කියන පොල්හේන දෙවන පටුමග වරි. අංක 17 දරන ඉඩම.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 13/99/NH/253.
2021 දෙසැම්බර් මස 10 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැඳුර'', අංක 1200/6,
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

EOG 06 - 0032


1A – G 36874 – 24 (2022/06)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*